දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
DEVI BALIKA VIDYALAYA - COLOMBO

මනසා සංවුතා ධීරා
MANASA SANVUTHA DHEERA

තෙවන වාර පරීක්ෂණය - 2011

07 ශ්‍රේණිය

# උඩරට නර්තනය I

කාලය: පැ. 02 යි

1. උඩරට නර්තනයේ පාද හුරුකර ගැනීමට නටන්නේ
   - i. දෙමිත පදයි.
   - ii. ගොඩ සරඹයි.
   - iii. පා සරඹයි.
   - iv. ඉලංගම් සරඹයි.

2. සරඹ නැටීමේදී නටන ලය වන්නේ
   - i. විලම්භ මධ්‍යද්‍රැත
   - ii. විලම්භ, ද්‍රැත හා අඩු ලය
   - iii. මධ්‍ය ද්‍රැත විලම්භ
   - iv. මැද, වැඩි, අඩු

3. අවකාශ භාවිතයේ ප්‍රධාන කොටස් 2 කි.
   - i. බිම් තලය, මැද තලය.
   - ii. පුද්ගල හා පොදු
   - iii. උඩු තලය හා දිසා
   - iv. දිසා හා පුද්ගල

4. "ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම්" යන පදය අයත් වන්නේ
   - i. 2 පා සරඹයටය.
   - ii. 2 ගොඩ සරඹයටය.
   - iii. 3 පා සරඹයටය.
   - iv. 3 ගොඩ සරඹයටය.

5. වන්නම් නැටීමේදී එක තැන සිට අත ගැනීම හඳුන්වන්නේ
   - i. කවි ගායනා වයනු වෙනි.
   - ii. ගී මැන්ඩිය යනුවෙනි.
   - iii. තානම් ගායනය යනුවෙනි.
   - iv. මේ කිසිවක් නොවේ.

පහත සඳහන් වාක්‍ය හරිනම් (   ) ලකුණ ද වැරදි නම් (   ) ලකුණ ද යොදන්න.

6. කස්තිරමක් නටන්නේ වන්නම ආරම්භයටය. (   )

7. උඩරට නර්තනය උඩනුවර යටි නුවර ප්‍රදේශයේ ප්‍රචලිත වේ. (   )

8. නිදහස සැමරීමේදී ජාතික ගිය ගායනා කිරීමෙන් ජාතියේ පෞඩත්වය කියාපායි. (   )

9. ජිංගත ගොගෝ මාත්‍රා දෙකේ තනිතිතට අයත් බෙර පදයකි. (   )

10. තුරඟා වන්නම මෙන් කියවෙන්නේ කන්ථක අසු පිළිබඳවයි. (   )

හිස් තැන් පුරවන්න

11. තිතෙහි කුඩාම ඒකකය .................................... වේ.

12. .................................... කුළු නැටුම් නැටීමේදී යොද ගනී.

13. .................................... පසුබිම් කොටගෙන ආශිර්වාද ගායනා බිහිකර ඇත.

14. තුරඟා වන්නම .................................................. තිතට අයත් වන්නමකි.

15. පෙරහැර පැවැත්වීමේදී දින ගණනක් වීදි සංචාරය කරන පෙරහැර .................................... පෙරහර නමින් ද හඳුන්වයි.

යා කරන්න.

| | |
|---|---|
| 16. දෙවියන්ට ඇති අධි භක්තිය සඳහා මිනිසුන් | නාට්‍යමය අංගයකි. |
| 17. සබරගමු සමන් දේවාල පෙරහැරේ ප්‍රධාන අංගයකි. | මඩුපේ කිරීම |
| 18. අඹ විදමන | ගොයම් නැටුමට අයත් වේ. |
| 19. ශාන්තිකර්ම කීපයකම දැකිය හැකි පූජා රටාවකි. | කවු ගසා නටයි. |
| 20. වරම් වරම් ඉරසඳ දෙව් අතින් වරම.................. මෙය | මහබඹා කෝලම |

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

පළමු ප්‍රශ්නයේ සියලුම කොටස්වලට පිළිතුරු සපයන්න.

1. නයනා :- ඉතින් සුවිනීතා, එද ප්‍රසංගයෙන් පස්සේ අපි හමුවුනේ අද නේද? කොහොමද ප්‍රසංගය

සුනීතා :- ගොඩක් හොඳයි හොඳ සංවිධානයක් තිබුණා.

නයනා :- සංවිධානය කීවේ

සුවිනීතා :- වෙලාවට පටන් අරන් ක්‍රමයකට අවසන් වුනා. ආරාධිත අමුත්තාත් වේලාවට ආවා.

මෙය ප්‍රසංගයක් අවසාන වූ පසු ඇසෙන සංවාදයකි. මේ අනුව පිළිතුරු සපයන්න.

i. ප්‍රසංගය සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ ............................ හැකියාවයි. (ල: 02)

ii. ප්‍රසංගයක් සංවිධානය කරන ඔබ මුලින්ම කළ යුත්තේ කුමක්ද? (ල: 01)

iii. ප්‍රසංගයකදී දැකිය හැකි චාරිත්‍ර අංගයක් නම් කරන්න. (ල: 01)

iv. එක් පුහුණු කණ්ඩායමක නායකයා ඔබ නම් ඔබ ළඟ තිබිය යුතු ගුණාංග 2 ක් ලියන්න. (ල: 02)

v. ඔබ නර්තන අංගයක සාමාජිකාවක් ෙ ඔබ එම නර්තනය සාර්ථක කර ගැනීමට කළ හැකි උදවු 2ක් ලියන්න. (ල: 02)

vi. සාමුහිකව කල හැකි නර්තන 2ක් නම් කරන්න. (ල: 02)

vii. උඩරට ශාස්ත්‍රීය නර්තනයක් සඳහා වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩය නම් කරන්න. (ල:1)

viii. ඔබ ප්‍රධාන සංවිධායක නම් එම ප්‍රසංගය සඳහා ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ල: 02)

ix. ආදේශ භාණ්ඩ යොදා ගනිමින් වාදන අංගයක් ඉදිරිපත් කරන්නේ නම් එ සඳහා භාණ්ඩයක් ඇඳ දක්වන්න. (ල: 02)